**<u>බේරුවල නගර සභාව</u>**
**<u>කළුතර දිස්ත්‍රික්කය</u>**

1. **<u>මූල්‍ය ප්‍රකාශන</u>**

1.1 **<u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 24 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූලි 24 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 **<u>මතය</u>**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට බේරුවල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම</u>**

1.3.1 **<u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ රු.300,000 කට මිලදී ගෙන තිබූ තල කම්පැක්ටරය ප්‍රාග්ධනගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ණය පදනම මත මිලදී ගෙන තිබූ රු.212,500 ක් වූ තොගය ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ජූනි සිට දෙසැම්බර් දක්වා තොග නිකුත් කිරීම් රු.1,823,850 ක් තොග ගිණුමෙන් අඩු කිරීම වෙනුවට ණයහිමි ගිණුමට එකතු කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී ඉදිරි වර්ෂය සඳහා දරන ලද වියදම් රු.12,425 ක් සඳහා අදාල ගැලපීම් සිදු කර නොතිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයේ කඩකුලී ආදායම රු.46,500 ක් අඩුවෙන් ගිණුම් ගත කිරීම නිවැරදි කිරීමේදී සමුච්චිත අරමුදලට ගිණුම් ගත කිරීම වෙනුවට අවිනිශ්චිත ගිණුමට ගිණුම් ගත කර තිබුණි.

(ඊ) ඉකුත් වර්ෂයේ ගිණුම් ගත කර නොතිබූ ස්ථාවර තැන්පත් පොලී රු.35,755 ක් ස්ථිර තැන්පත් ගිණුමට හා සමුච්චිත අරමුදල් ගිණුමට ගිණුම් ගත කළ යුතු වුවත් තැන්පත් ගිණුමට හා අවිනිශ්චිත ගිණුමට ගිණුම් ගත කර තිබුණි.

(උ) මාර්ග තලනයේ වටිනාකම ඉකුත් වර්ෂයේදී ප්‍රාග්ධනිත කිරීමේදී ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමට රු.2,135,000 ක් වැඩියෙන් ගිණුම් ගත කර තිබීම නිවැරදි කිරීමේදී අදාල ගිණුම්වලට රු.1,682,822 ක් පමණක් ගිණුම් ගත කර තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය ආරම්භයට අවිනිශ්චිත ගිණුමේ රු.10,040 ක් වූ හර ශේෂය හඳුනාගැනීමකින් තොරව සමුච්චිත අරමුදලට කපා හැර තිබුණි.

(එ) ඉකුත් වර්ෂයේ දේශීය ණය හා සංවර්ධන අරමුදලින් ලබා ගෙන තිබූ රු.8,540,000 ක ණය, ගිණුම් ගත කිරීමේදී මුදල් ගිණුම හා සමුච්චිත අරමුදල් ගිණුම හර කර ණය ගිණුම පමණක් බැර කර තිබුණි.

(ඒ) ගබඩා මිලදී ගැනීම් රු.32,030 ක්, වියදම් ශීර්ෂවලට සටහන් වී තිබීම නිවැරදි කිරීමේදී ගබඩා ගිණුම එම වටිනාකමින් හර කර සමුච්චිත අරමුදල් ගිණුම බැර කළ යුතු වුවත් අවිනිශ්චිත ගිණුමට බැර කර තිබුණි.

(ඔ) ඉකුත් වර්ෂයේ වෙළඳ බලපත්‍ර ආදායම රු.71,141 ක් වැඩියෙන් බිල් කිරීම සමාලෝචිත වර්ෂයේ නිවැරදි කිරීමේදී සමුච්චිත අරමුදල් ගිණුමෙන් අඩු කිරීම වෙනුවට අවිනිශ්චිත ගිණුමට ගිණුම් ගත කර තිබුණි.

1.3.2 **<u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.1,928,460 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. **<u>මූල්‍ය සමාලෝචනය</u>**

2.1 **<u>මූල්‍ය ප්‍රතිඵල</u>**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදයම රු.20,858,335 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,365,490 ක් විය.

2.2 **<u>ආදායම් පරිපාලනය</u>**

2.2.1 **<u>ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්</u>**

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000' | රු.000' | රු.000' |
| (i) වරිපනම් හා බදු | 16,400 | 6,925 | 18,005 |
| (ii) බදු කුලී | 12,650 | 11,501 | 1,161 |
| (iii) බලපත්‍ර ගාස්තු | 86 | 84 | 2 |
| (iv) වෙනත් ආදායම් | 129 | 129 | -- |

2.2.2 **<u>වරිපනම් බදු</u>**

සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ වරිපනම් බදු ශේෂය රු.8,613,088 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු බිල් කිරීම රු.16,400,480 ක් විය. සභාව වර්ෂ 16 කට පසු 2013 වර්ෂයේ නව වරිපනම් බදු තක්සේරුවක් සිදු කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු බිල් කිරීම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 440 කින් වැඩි වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු ශේෂය රු.19,317,598 ක් වූ අතර ඉන් විගණිත දිනය වූ 2015 පෙබරවාරි 28 දිනට තවදුරටත් රු.16,997,036 ක් හිඟව පැවතුණි. රු.20,000 ට වඩා වැඩි හිඟ ශේෂයක් සහිත දේපල 49 ක් වූ අතර එකතු වටිනාකම රු.1,778,501 ක් විය.

2.2.3 **<u>කඩකුලී</u>**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට කාමර 51 කින් අයවිය යුතු හිඟ කඩකුලී ශේෂය රු.689,244 ක් විය.

(ආ) ඉහත කඩකාමරවල මාසික කුලිය සළකා බැලීමේදී දල වශයෙන් මාස 3 සිට වර්ෂයක කාලපරාසයකට අදාල කුලී හිඟව පැවතුණි.

(ඇ) බදු ගිවිසුම් අනුව අඛන්ඩව මාස 03 ක් බදු කුලිය ගෙවීම පැහැර හැරියහොත් අදාල කඩකාමර සභාවට පවරාගැනීමට කටයුතු කළ යුතු වුවත් ඉහත කඩකාමර සම්බන්ධයෙන් එසේ සිදු කර නොතිබුණි.

(ඈ) කඩකුලී ගිවිසුම් 1998 න් පසු යාවත්කාලීන කර නොතිබුණි.

3. **<u>මෙහෙයුම් සමාලෝචනය</u>**

3.1 **<u>අවිධිමත් ගනුදෙනු</u>**

නගර සභා ආඥා පනතේ (255 අධිකාරියේ) 159(ඊ) වගන්තිය අනුව යම් ආගමික,පුණ්‍ය,සංස්කෘතික කාර්යයක් සම්බන්ධයෙන් වියදම එක් වර්ෂයකට මුළු එකතුව රු.5,000 කට වඩා වැඩිවන්නේ නම් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු වුවත් එසේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව 2014 වර්ෂයේ සාහිත්‍ය උත්සවය වෙනුවෙන් රු.139,120 ක මුදලක් සභා අරමුදලින් වැය කර තිබුණි.

3.2 **<u>කොන්ත්‍රාත් පරිපාලනය</u>**

මාර්ග සඳහා පළමු වර තාර ආලේපනය සිදු කර සති 2 ක් තුළ දෙවන වර තාර අලේපනය සිදු කල යුතු වුවත් කංකානම්ගොඩ අතුරු පාර, තලවගොඩ පාර, රවුන් මාවත, ස්කාගාර පාර සඳහා පිළිවෙලින් 2014 ජූලි 30, අප්‍රේල් 29, අප්‍රේල් 04, මාර්තු 03, දිනවල පළමු වර තාර ආලේපනය කර තිබුණද විගණිත දින වන විට මාස 07 ක්, මාස 11, මාස 10, අවුරුදු 01 ක් ගත වී ඇතත් දෙවන වර තාර ආලේපන කර නොතිබූ බව 2015 මාර්තු 19 දින සභාවේ තාක්ෂණ නිලධාරිණිය සමඟ කරන ලද භෞතික පරීක්ෂණයේදී අනාවරණය විය.

3.3 **<u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>**

3.3.1 **<u>අත්තිකාරම් ගෙවීම</u>**

2008, 2011, හා 2013 වර්ෂවල පිළිවෙලින් ලබා දී තිබූ රු.148,040, රු.10,000, රු.36,500 ක් වූ අත්තිකාරම් 2014 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි.

3.3.2 **<u>සේවක ණය</u>**

සේවය හැර ගිය, මිය ගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් 23ක ගෙන් අය විය යුතු රු.190,807 ක සේවක ණය ශේෂයක් 2014 දෙසැම්බර් 31 දින වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4. **<u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර විගණනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) වාහන පාලනය